# කොළඹ මහා නගර සභාව

## පුරප්පාඩු දැන්වීම

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කාර්යාල සේවක සේවයේ III පන්තියේ (කාර්යාල කාර්ය සහායක) තනතුරු සඳහා බඳවා ගැනීම 2018**

කොළඹ මහා නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල ශිලිපීය නොවන ගණයේ කාර්යාල සේවක සේවයේ III පන්තියේ (කාර්යාල කාර්ය සහායක) තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි පහත සුදුසුකම් සපුරා ඇති ගැහැණු / පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙළ කරගත් අයදුම්පතක් **"නාගරික කොමසාරිස්, නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07".** යන ලිපිනයට **2018.06. 06** වන දිනට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත් බහාලන කවරයේ වම්පස **(බ.ප.) පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවය III පන්තියේ (කාර්යාල කාර්ය සහායක) තනතුර** යනුවෙන් සඳහන් කළ යුතු අතර, 2018.06.06 වන දිනට පසුව ලැබෙන අයදුම්පත් සළකා බලනු නොලැබේ.

1. තනතුරු නාමය :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවය III පන්තියේ (කාර්යාල කාර්ය සහායක)තනතුර
2. මාසික වැටුප් ක්‍රමය :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව PL 1 - 2016
   24250 – 10x250 – 10x270 – 10x300 – 12x330 – 36410/-
   (වැටුප් ගෙවනු ලබන්නේ උපලේඛණ 02 හි සඳහන් පරිදි වේ)
3. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.
4. සුදුසුකම් :-
   I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
   II. අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
   III. යහපත් චරිතයකින් යුක්ත වීම.
   IV. තනතුර සඳහා ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයේ සිට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
   V. තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.
   VI. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය)

VII. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

5. කාර්යාල සේවක සේවයේ III පන්තිය (කාර්යාල කාර්ය සහායක) තනතුරට බඳවා ගැනීම් සම්බන්ධයෙන් අවසාන තීරණය නාගරික කොමසාරිස් සතු වේ.

එල්.ආර්.එල් වික්‍රමරත්න,
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

2018.05 ........ වන දින
නාගරික කොමසාරිස් කාර්යාලය,
කොළඹ මහා නගර සභාව.
පුරහල, කොළඹ 07.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම් පත්‍රය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කාර්යාල සේවක සේවය III පන්තියේ (කාර්යාල කාර්ය සහායක) තනතුරු සඳහා බඳවා ගැනීම 2018

1. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (Mr/Mrs/Ms) :-

2. මුලකුරු සමග නම (සිංහලෙන්) :-……………………………………………………………

……………………………………………………………………………………………………

3. මුලකුරු වලින් හැඳින්වෙන නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

4. I. ස්ථිර ලිපිනය(සිංහලෙන්) :-

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………..

II. ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

III. තාවකාලික ලිපිනය(සිංහලෙන්) :-

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

5. උපන් දිනය :-අවුරුද්ද මාසය දින

6. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :-අවුරුදු මාස දින

(උප්පැන්න සහතිකයේ, සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය)

7. ජාතික හැඳුනුම්පත් අංකය :-

8. විවාහක/අවිවාහක :-……………………………………………………………………

9. දුරකතන අංකඃ පෞද්ගලික/කාර්යාලීය :-……………………………………………………

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව :-------------------------------------------------

(ග්‍රාම සේවා සහතිකයේ ඡායා පිටපතක් අමුණා සනාථ කළ යුතුය)

11. අධ්‍යාපන සුදුසුකම් :- ....................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතික වල සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

12. වෘත්තීය සුදුසුකම් :- (තිබේනම් පමණි.) ................................................................................

.............................................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) :- ..................................................................................

.............................................................................................................................................

(සුදුසුකම් පරීක්‍ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. I. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? (ඔව්/නැත)

II. ඔබගේ පිළිතුර 'ඔව්' නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද?

.............................................................................................................................................

.............................................................................................................................................

15. ඔබ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් මීට පෙර සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වූ තැනැත්තෙක්ද? (ඔව්/නැත)

16. I. දැනට දරණ තනතුර (සිංහලෙන්):- ............................................................................

II. එම තනතුරට පත්වූ දිනය :- ............................................................................

III. සේවය කරන දෙපාර්තමේන්තුව/අංශය :- ............................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කාර්යාල සේවක සේවයේ III පන්තියේ (කාර්යාල කාර්ය සහායක) තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා කාර්යාල සේවක සේවයේ III පන්තියේ (කාර්යාල කාර්ය සහායක) තනතුරකට නුසුදුස්සෙකු වන බවත්, පත්කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිඳු වන්දියකින් තොරව සේවයෙන් පහකළ හැකි බවත් මා දනිමි.

දිනය :- ...................................... ......................................

අයදුම්කරුගේ අත්සන